# බෞද්ධ කතාවන්හි පරමාදර්ශී චරිත පොදුබවට පත් කිරීම වස් නූතන ගේය පද රචකයා ගෙන ඇති ප්‍රවේශ

ඩබ්. එම්. ඩබ්. එම්.විජේතුංග[1]

බෞද්ධ කතාවන්හි එන පරමාදර්ශී චරිත අරබයා පොදුජනයා ප්‍රතිචාර දක්වන්නේ ආකාර ද්විත්වයකින් බව ඔවුන්ගේ පරමාදර්ශී චරිත කේන්ද්‍ර කරගත් වාගාලාපවල ස්වභාවය නිරීක්ෂණය කිරීමෙන් පෙනී යයි. "එයා බෝධිසත්ත්වයෙක් වගේ" යන ලෙස අගය කිරීම් වේශයෙන් හඳුන්වන ඔවුන් තවත් විටෙක එම ප්‍රස්තුතයම ගැරහීම් ස්වභාවයෙන් "බෝධිසත්ත්වයෙක් වෙන්න හදන්න එපා"ලෙස යොදයි. එවන් විටෙක සිදුවන්නේ වක්‍ර ලෙස පරමාදර්ශී චරිත ප්‍රශ්න කිරීමකි. බෞද්ධ පරමාදර්ශී චරිත අරබයා ධනාත්මක හෝ සෘණාත්මක ලෙස මෙසේ ජනතාව ප්‍රතිචාර දැක්වීමෙන් ප්‍රකට වන්නේ පරමාදර්ශී චරිත පොදුබවට පත්කර ගැනීමට ජනතාව තුළ පවතින විභවතාවයි. එසේම එම චරිත අගය කිරීමට මෙන්ම ප්‍රශ්න කිරීමටද ජනතාව තුළ පවතින කැමැත්තයි. පරමාදර්ශී චරිත අරබයා ජනතාව දක්වන මෙම දෙයාකාරී ප්‍රවේශ සිංහල ගේය පද නිර්මාණ තුළින් වෙනත් ලෙසකින් ඉදිරිපත් වන බැව් විචාරක්ෂියට හසු වේ. එනම් වරෙක එම පරමාදර්ශී චරිත පරමාදර්ශී තලයේම තබා උත්කර්ෂයෙන් ප්‍රතිනිර්මාණය කිරීම හා තවත් විටෙක එම චරිතවල පරමාදර්ශී ලක්ෂණ ප්‍රශ්න කිරීම යන ප්‍රවේශ ද්වයයි. ස්වභාවයෙන් මිනිසා පරමාදර්ශී චරිතවලට දක්වන අගය කිරීම හා ප්‍රශ්න කිරීම යන ද්විත්ව ප්‍රවේශ සිංහල ගේය පද රචකයන් එම චරිත ජනතාව අතරට ගෙනයෑමට උපස්ථම්භ කොටගෙන ඇති අයුරු එම ගේය පද නිර්මාණ ඇසුරින් සනිදර්ශනාත්මක විමර්ශනය කිරීම මෙම ගවේෂණයේ ආධ්‍යාශයයි.

පරමාදර්ශී චරිත උත්කර්ෂය කොට ජනතාව අතරට ගෙන යෑමට උත්සහ කළ ගීත අතර බුද්ධ චරිතය වෙසෙසීමටසුසිරි සිරිවර්ධන විසින් රචනා කරන ලද "ලඹ සවන් රන් පටින්", යශෝදරා චරිතය වර්ණනා කිරීම වස් ලියවුණු රඹුක්කන සිද්ධාර්ථ හිමිගේ"ළා දළු බෝපත් සෙමින් සැලෙන සේ යශෝදරා දේවි", සුනිල් සරත් පෙරේරාගේ"සිතේ නැඟුණු කලකිරීම කුමරිය" යනාදී ගීත සනිදර්ශන කොට දැක්විය හැකිය. එසේම බෞද්ධ කතාවල එන පරමාදර්ශී චරිත අභියෝගයට ලක්කරන ගීත අතරවිශාඛා මහ උපාසිකාව ප්‍රස්තුත කරගෙන ජයරත්න ගමගේ රචනා කළ"සූසැට බරණින් සැරසීලා", වෙස්සන්තර චරිතය ප්‍රශ්න කිරීම වස් රත්න ශ්‍රී විජේසිංහයන් විසින් රචනා කරන ලද "මගේ බිසවුනේ අසාපන්"සෝමතිලක ජයමහ විසින් නන්ද චරිතය අලළා ලියන ලද "නවදලි හේනක පැව වැදිරි රුව", රත්න ශ්‍රී විජේසිංහයන් විරචිත "මේ කිඳුරු විමානය නම්" යනාදි ගීත කැපී පෙනෙයි. පරමාදර්ශී චරිත අගය කිරීම් වේශයෙන් මෙන්ම අභියෝගයට ලක්කරන ගේය පද නිර්මාණද එකසේ ජනකාන්ත බැව් දක්නට ඇති අතර එහිඅර්ථය එම පරමාදර්ශී චරිතද ජනයා අතරට ප්‍රවේශ වී පොදු බවට පත්ව ඇති බවයි. ස්වභාවයෙන් මිනිසා පරමාදර්ශී චරිතවලට දක්වන අගය කිරීම හා ප්‍රශ්න කිරීම යන ද්විත්ව ප්‍රවේශ සිංහල ගේය පද රචකයන් එම චරිත ජනතාව අතරට ගෙනයෑමට උපස්ථම්භ කොට ගෙන ඇති බව ප්‍රතීතය.

**ප්‍රමුඛ පද :** පරමාදර්ශී චරිත, ගේය පද, පොදු බව, අගය කිරීම, ප්‍රශ්න කිරීම

---

1 සහාය කථිකාචාර්යාණී, සිංහල අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
wishwanimaheshika@gmail.com